# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1443 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 08/09/2024<br>පැය 1035 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුර**

2024.09.08 වන දින දිවා කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුරේ නිලධාරින් කණ්ඩායමක් විසින් පොතුවිල් පොලිස් වසමේ ගල්කන්ද අසල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ ලාහුගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. ගංජා පැළ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුර**

2024.09.07 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තණමල්විල පොලිස් වසමේ අරබේකෙම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර වගාකරන ලද ගංජා පැල 1460 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ හම්බෙගමුව ඌරුතොර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර**

2024.09.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කුඩාඔය පොලිස් වසමේ කිවුලපිටිය වැව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ගංජා ග්‍රෑම් 320 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුඩාඔය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ ඌවකුඩාඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කුඩාඔය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**